මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PFD/REG/FD/CM/RE
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.04. 11

චක්‍රලේඛ ලිපි අංක 1/2025(අරමුදල්)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
විශේෂ වියදම් ඒකකවල ප්‍රධානීන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යාවස්ථාපිත මණ්ඩල, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන්

**ව්‍යාවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනත අනුව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සහ ව්‍යාවස්ථාපිත අරමුදල්වල කටයුතු නියාමනය කිරිම.**

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2024.11.06 දිනැති අංක 04/2024 හා 2025.02.28 දිනැති අංක 01/2025 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ මගින් ලබා දී ඇති උපදෙස් සම්බන්ධයෙනි.

02. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යාවස්ථාපිත මණ්ඩල හා අනෙකුත් ආයතන විසින් විවිධ අරමුණු සඳහා ව්‍යාවස්ථාපිත නොවන අරමුදල් පවත්වාගෙන යනු ලබන බවට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට වාර්තා වී ඇත. එහෙත්, එම ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනතේ 39(4) වගන්තිය අනුව මෙම පනත ක්‍රියාත්මක වන දින සිට වසරක් ඇතුළත එනම් 2025.08.07 දිනට පෙර විසුරුවා හැරීම හෝ ඉදිරියට පවත්වාගෙන යාම අවශ්‍ය වේ නම් භාණ්ඩාගාර ලේකම්වරයා, විමසා මුදල් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබුවහොත්, එය ව්‍යාවස්ථාපිත අරමුදලක් බවට පරිවර්තනය කරනු ලැබිය හැකි වේ.

03. ඒ අනුව, එම අන්තර්කාලය තුළ මෙම ව්‍යාවස්ථාපිත නොවන අරමුදල්වල කටයුතු අරමුදලේ ප්‍රකාශිත අරමුණුවලට අනුකූලව ක්‍රියාත්මක වන බවටත්, එම අරමුදල් විසුරුවා හැරීම හෝ ව්‍යාවස්ථාපිත අරමුදලක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාදාමය නිසි පරිදි සිදුවන බවටත්, අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට ලක්විය යුතු බව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන අනුව අපේක්ෂා කෙරේ.

04. එම අරමුදල් විසුරුවා හැරීම හෝ ව්‍යාවස්ථාපිත අරමුදල් බවට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය පරිදි වාර්තා කළ යුතු වන අතර, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් එහි ප්‍රගතිය නිරන්තර අධීක්ෂණයට ලක් කරනු ඇත. මේ සම්බන්ධව ක්‍රියාකළ යුතු ආකාරය 2024.11.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 මගින් ඔබ වෙත දැනුම් දී ඇති බව ද කාරුණිකව දන්වා සිටින අතර, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට හඳුනාගත් සියලුම ව්‍යාවස්ථාපිත හා ව්‍යාවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධව ආයතන කැඳවා ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව දැනටමත් දැනුවත් කිරීම් සිදු කොට ඇත.

05. ඒ අනුව, ඔබ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හෝ ඒවා යටතේ ඇති ආයතන සතුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් තවදුරටත් පවතින්නේ නම් ඒ සම්බන්ධයෙන් 2024.11.06 දිනැති හා අංක 04/2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව නොපමාව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, එහි ප්‍රගතිය 2025.04.30 දින වන විට මෙම දෙපාර්තමේන්තුවට වාර්තා කරන ලෙසත් කාරුණිකව දන්වමි.

06. එසේම ව්‍යවස්ථාපිත අරමුදල් සම්බන්ධයෙන් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39(2) හා 39(3) (ඇ) වගන්ති ප්‍රකාරව ඉදිරිපත් කළයුතු වාර්තා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් 2025.02.28 දිනැති හා අංක 01/2025 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ලබා දී ඇති අතර, එහි පිටපතක් මේ සමග අමුණා ඇත. එම රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අමුණා ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර මෙතෙක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට එවීමට කටයුතු කර නොමැති නම්, ඒ ඒ ව්‍යවස්ථාපිත අරමුදල වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් එම ආකෘතිය සම්පූර්ණ කොට 2025.04.30 දිනට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස ද කාරුණිකව දන්වා සිටින අතර, එය උක්ත විධිවිධාන ප්‍රකාරව නෛතික අවශ්‍යතාවයක් බව ද තවදුරටත් පෙන්වා දෙමි.

07. එසේම 2024.11.06 දිනැති අංක 04/2024 හා 2025.02.28 දිනැති අංක 01/2025 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය විමසා බැලීම පිළිබඳ කරුණු ඔබ අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ හා අනෙකුත් ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙස ද වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

08. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු හා පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ දුරකතන අංක 0112034537 හා 0112484636 අමතන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්:
(1) ජනාධිපති ලේකම්
(2) අග්‍රාමාත්‍ය ලේකම්
(3) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(4) විගණකාධිපති